संस्कृत पाठमाला । २

සංස්කෘත පාඨමාලා 2

वन्दना

नमो बुद्धाय गुरवे नमो धर्माय शासिनो ।
नमस्संघाय महते त्रिभ्यो गुरवे नमः ॥१॥
गुरवे सर्वलोकानां भिषजे भवरोगिनाम् ।
निधये सर्वविद्यानां दक्षिणामूर्तये नमः ॥२॥
अज्ञान तिमिरान्धस्य ज्ञानांजन शलाकया ।
चक्षुरुन्मीलितं येन तस्मै श्री गुरवे नमः ॥३॥
सर्वे भवन्तु सुखिनः सर्वे सन्तु निरामयाः ।
सर्वे भद्राणि पश्यन्तु मा कश्चिद्दुःखभाग्भवेत् ॥४॥

දුරවබෝධ පද

गुरवे - ගුරුවරයාණන් වහන්සේට **शासिनो** - අනුශාසන **नमस्संघाय** - **(नमः+संघाय)** සංඝරත්නයට නමස්කාරය වේවා **महते** - ශ්‍රේෂ්ඨ වූ **निरामयाः** - නිරෝගි වූවෝ **कश्चिद्दुःखभाग्भवेत्** - **(कश्चित्+दुःखभाग्+भवेत्)** කිසිවෙක් දුකට පත්වීම (නො) වේවා **भिषजे** - ඖෂධයක් වීම පිණිස **भवरोगिनाम्** - භවරෝගීන්ට **निधयेसर्वविद्यानां** - සියලු ශාස්ත්‍රයන්ට නවාතැනක් වීමට **दक्षिणामूर्तये** - **तिमिरान्धस्य (तिमिर+अन्धस्य)** අන්ධයාගේ අඳුර **ज्ञानांजन** - **(ज्ञान+अंजन)** නුවණ නැමති අඳුන් **शलाकया** - අඳුන් ගාන කූරෙන් **चक्षुरुन्मीलितं** - **(चक्षुः + उन्मीलितं)** - ඇස ඇරීම

०१ आम्लं द्राक्षाफलम् ।

एकः शृगालः ।
एकः शृगालः वनं गच्छति ।...../
पिपासा तस्य बुभुक्षा
पिपासया बुभुक्षया वनं गच्छति ।
सः वनं गच्छति ।
तत्र गच्छति किमपि न लभते ।...../
इतोऽपि गच्छति किमपि न लभते ।...../
श्रान्तः जायते खिन्नः जायते ।...../
किं च करोति सः किं च करोति ।...../
वामतः पश्यति दक्षिणतः पश्यति
अग्रतः पश्यति पृष्ठतः पश्यति...../
स्वेदः जायते तृषा जायते ।
तस्य स्वेदः जायते तृषा जायते ।
किम् च पश्यति सः किम् च पश्यति ।...../
पश्यति द्राक्षालताम्
सः पश्यति द्राक्षाफलम् ।...../
उपरि उपरि लतासु
दृश्यते च तत् फलम् ।...../
अनुक्षणम् तं मुखे रसः जायते ।...../
किं च करोति सः किं च करोति ।...../
एकवारं उत्पतति द्विवारं उत्पतति
त्रिवारं उत्पतति पुनः पुनः उत्पतति ।...../
स्वेदः जायते श्रमः जायते ।
तस्य स्वेदः जायते श्रमः जायते ।
किं कथयति सः किं कथयति ।...../
आम्लं द्राक्षाफलं आम्लं द्राक्षाफलम् ।
इत्येवं कथयति सः पलायते ।...../

අර්ථ පරිවර්තනය

එක් සිවලෙක්

එක් සිවලෙක් වනයට යයි......//
පිපාසයයි ඌට කුසගින්නයි
පිපාසයෙන් කුසගින්නෙන් වනය තුළට යයි
ඌ වනය තුළට යයි
එහාට ඌ යයි කිසිවක් නොලැබේ......//
මෙතැනින් ඌ යයි කිසිවක් නොලැබේ......//
විඩාවක් දැනෙන්නේ වෙහෙස දැනෙන්නේ
මොකද කරන්නේ ඌ මොකද කරන්නේ?......//
වම දිශාව බලයි දකුණත (යළි) බලයි
ඉදිරිදෙස ද බලයි පිටුපස ඌ බලයි......//
ඇඟ දහඩිය ඇතිවන්නේ පවස ද වන්නේ
උගේ, ඇඟ දහඩිය ඇතිවන්නේ පවස ද වන්නේ
කුමක් දකින්නේ ඌ කුමක් දකින්නේ?......//
දකියි ඌ සොඳුරු මිදි වැලක්
දකියි ඌ මිදි පොකුරක්
ඉහළ ඉහළ වැල්වල
දකිනු ලැබේ ඒ ගෙඩි......//
මොහොතකින් ඔහු මුවේ රසය පහළවේ......//
මොකද කරන්නේ ඌ මොකද කරන්නේ?......//
එක පාරක් උඩපනියි දෙපාරක් උඩපනියි
තුන්පාරක් උඩපනියි නැවත නැවත උඩපිනියි......//
වෙහෙස ඌට දැනෙන්නේ විඩා දැනෙන්නේ
ඌට, වෙහෙස දැනෙන්නේ විඩා දැනෙන්නේ
කුමක් කියන්නේ ඌ කුමක් කියන්නේ......//
හරි ඇඹුලයි මේ මිදි හරි ඇඹුලයි මේ මිදි

මෙලෙසින් ඌ කියමින්නේ ඌ පැනයන්නේ......//

දුරවබෝධ පද

बुभुक्षा - කුසගින්න
लभते - ලබනු ලැබේ
श्रान्तः - මහන්සිය
खिन्नः - වෙහෙස/විඩාව
जायते - උපදිනු ලැබේ
किं - කුමක්
वामतः - වම්පස
दक्षिणतः - දකුණු පස
अग्रतः - ඉදිරි පස पृष्ठतः - පිටුපස स्वेदः - දහඩිය तृषा - පිපාසය
द्राक्षालताम् - මිදිවැල द्राक्षाफलम् - මිදිගෙඩිය उपरि - උඩ अनुक्षणम् - මොහොතට අනුව उत्पतति - උඩපනියි श्रमः - වෙහෙස
आम्लं - ඇඹුල් एत्येवं - (इति+एवं) पलायते - පැන යනු ලැබේ

०२ लालनगीतम्

उदिते सूर्ये धरणी विहसति।
पक्षी कूजति कमलं विकसति ॥१॥
नदति मन्दिरे उच्चैर्ढक्का।
सरितः सलिले सेलति नौका ॥२॥
पुष्पे पुष्पे नानारङ्गाः।
तेषु डयन्ते चित्रपतङ्गाः ॥३॥
वृक्षे वृक्षे नूतनपत्रम्।
विविधैर्वर्णैर्विभाति चित्रम् ॥४॥
धेनुः प्रातर्यच्छति दुग्धम्।
शुद्धं स्वच्छं मधुरं स्निग्धम् ॥५॥
गहने विपिने व्याघ्रो गर्जति।

उच्चैस्तत्र च सिंहः नर्दति ॥६॥
हरिणोऽयं खादति नवघासम्।
सर्वत्र च पश्यति सविलासम् ॥७॥
उष्ट्रः तुङ्गः मन्दं गच्छति।
पृष्टे प्रचुरं भारं निवहति ॥८॥
घोटकराजः क्षिप्रं धावति।
धावनसमये किमपि न खादति ॥९॥
पश्यत भल्लुकमिमं करालम्।
नृत्यति थथथै कुरु करतालम् ॥१०॥

අර්ථ පරිවර්තනය

නැළවිලි ගීය

මිහිකත හිනැහෙයි හිරු උදයේදී
කුරුල්ල නදදෙයි පද්මය පිබිදෙයි
මහ හඬදෙයි බෙරයක් මන්දිරයෙහි
ගං දියෙහි නැවකී සෙලවෙන්නේ
මලෙහි මලෙහි විසිතුරු වූ නැටුමයි
ඒවායෙහි සමනළයෝ පියඹත්
ගසෙහි ගසෙහි අලුතෙන් සැදි පත්‍රයි
නේක වර්ණයෙන් බබළන චිත්‍රයි
උදෑසන ම කිරි ලැබදෙයි එළදෙන
පිරිසිදු නිම්ල මිහිරි වූ සරුබර
ව්‍යාඝ්‍රයා ගුගුරයි ඝනකැලයෙහි
උස් හඬකින් ගොරවයි සිංහයා එහි

අභිනව තණකොළ කයි මේ මුව තෙම
විනෝදයෙන් නරඹයි උෟ හැමතැන
උස් වූ ඔටුවා සෙමෙන් සෙමෙන් යයි
මහත් බරක් උෟ පිටෙහි දරා යයි
ඉක්මන් ගමනින් අස්රජ දිවයයි
දුවන ගමන් උෟ කිසිවක් නොම කයි
බිහිසුණු මේ වළහා බලපල්ලා
ඨඨෛඨ අත්පුඩි දී නටපල්ලා

දුරවබෝධ පද

उदिते - උදාවූ කල්හි **धरणी** - පොළොව **उच्चैर्ढक्का** - (उच्चैः+ढक्का) **उच्चैः** - උස් හඬින් **ढक्का** - බෙරය **सरित्** - ගංගාව **सलिले** - ජලයේ **सेलति** - සෙලවෙයි **नानारङ्गः** - විවිධ නැටුම් **डयन्ते** - පියාඹනු ලැබෙත් **चित्रपतङ्गाः** - සමනළයෝ **नूतन** - අලුත් **विभाति** - දීප්තිමත් ව බබළයි **स्वच्छं** - පිවිතුරු **स्निग्धम्** - සාරවත්,උකු,මේද **गर्जति** - ගොරවනවා **गहनेविपिने** - ඝනකැලයේ **नर्दति** - හඬ නගනවා/ගොරවනවා **हरिणः** - මුවා **नवघासम्** - අලුත් තණකොළ **सविलासम्** - විනෝද සහිත ව/ක්‍රීඩාශීලී ව **तुङ्गः** - උස **मन्दं** - සෙමින් **प्रचुरं** - බොහෝ **निवहति** - උසුලයි **क्षिप्रं** - වහා **किमपि** (किं+अपि) කුමක් වත් **भल्लुकमिमं** - (भल्लुकं+ इमं) (भल्लूकः) මේ වළහා **करालम्** - දරුණු/බිහිසුණු **करतालम्** - අත්පුඩි

०३ विश्वासो नैव कर्तव्यम्।

एकं वनम् अस्ति। वने एका अजा अस्ति। सा एकदा स्वपुत्रं वदति "पुत्र, अहं बहिः गच्छामि। अहं शीघ्रं पुनः आगच्छामि। अत्र एव तिष्ठतु।" अतः सा वनं गच्छति। शिशुः अपि सा अनुसरणं करोति। शिशुः मर्गं विस्मरति। अतः सः रोदिति। एकः शृगालः तं शिशुं पश्यति। सः सुकोमलं मांसं खादितुम् इच्छति। अजस्य समीपं आगच्छति पृच्छति च "भवान् कः? किमर्थं रोदिति?" सर्वं ज्ञात्वा अति करुणतया सः वदति, "चिन्ता मास्तु, अहं मातुः समीपं त्वं नेष्यामि। मया सह चलतु। सा मम परिचिता अस्ति।"

अजाशिशुः वदति "अहं भवन्तं न जानामि। मम माता यत् अपरिचितेन सह कुत्रापि न गमनीयम् इति।" वञ्चकः शृगालः वदति, "मम विषये मा चिन्तयतु। पश्यतु तत्र एकः न्यग्रोधवृक्षः अस्ति। तत्र भवतः माता त्वम् अन्विष्यति।" अजाशिशुः शृगालेन

सह गच्छति। तस्मिन् क्षणे अजा तत्र आगच्छति। स्वपुत्रेण सह वञ्चकं शृगालं दृष्ट्वा वदति। "पुत्र, एतेन सह भवान् कुत्र गच्छति? अस्य विश्वासः न कर्तव्यः।" शिशुः मातुः समीपं धावति। शिशुमुखात् घटनां श्रुत्वा अजा क्रुध्यति। सा शृगालं प्रहरति स्म। शृगालः पलायति स्म। अजा शिशुं वदति "पुत्र, अपरिचितस्य उपरि कदापि विश्वासः नैव कर्तव्यः। न मैत्री कर्तव्या न कुत्रापि गमनीयम् कदापि मातुः वचनं न छेदनीयम् इति सः पुत्रः अबोधयत्।

අර්ථ පරිවර්තනය

විශ්වාස නොකළ යුතු ම ය.

එක් කැලෑවක් ඇත. එහි එක් එළුදෙනක් ද වේ. ඈ එක් දවසක් තම පුතුට කියයි. ''දරුව, මම පිටතට යමි. මම ඉක්මනට නැවත පැමිණෙමි. මෙහි ම ඉන්න.'' අනතුරුව ඇය කැලයට යයි. පැටවා ද ඇය අනුව යයි. පැටවා මං මුළා වේ. ඉක්බිති ඌ අඬයි. එක් සිවලෙක් ඒ පැටවා දකියි. ඌ සුකොමළ වූ මස් කෑමට කැමති වෙයි. සිවලා එළුවාගේ සමීපයට එයි විමසයි. ''නුඹ කවුද? කුමක් නිසා අඬන්නෙහි ද?'' සියල්ල දැන අතිශය කරුණාවෙන් මෙන් ඌ කියයි. ''ගණන් ගන්න එපා, මම මවගේ සමීපයට නුඹ රැගෙන යන්නෙමි. මා සමඟ එන්න. මම ඇයව හොඳින් දන්නවා.''

එළු පැටවා කියයි. ''මම ඔබව නොහඳුනමි. මගේ අම්මා අඳුනන්නේ නැති කිසිවෙකු සමඟ කොහෙවත් නොයා යුතුයි යැයි කියා ඇත.'' කපටි සිවලා කියයි ''මං ගැන එහෙම වැරදියට හිතන්න එපා. බලන්න, අතන එක් නුග ගසක් තිබේ. එහි නුඹේ මැණියන් නුඹ සොයමින් සිටින්නීය. '' එළු පැටවා සිවලා සමඟ යයි. එකෙණෙහි ම එළුදෙන එතැනට පැමිණෙයි. තම පුත්‍රයා සමඟ සිටින කපටි සිවලා ද දැක කියයි. ''දරුව, නුඹ මොහු සමඟ කොහි යන්නෙහි ද? මොහු විශ්වාස නොකළ යුත්තෙකි.'' පැටවා මවගේ සමීපයට දුවයි. පැටවාගේ මුවින් නිකුත් වූ හඬ අසා එළුදෙන කිපෙන්නීය. ඇය සිවලාට පහර දුන්නී ය. සිවලා පලා ගියේය. එළුදෙන පැටවාට කියන්නීය. ''පුත්‍රය නොහඳුනන අය පිළිබඳ ව කිසිදිනෙක විශ්වාස නොතැබිය යුතුය. මිතුරුකම් නොකළ යුතුය. කිසි තැනක නොයා යුතුය.'' යනුවෙනි. මවගේ වචන කිසිදිනෙක නොබිඳිය යුතු යයි ඒ පුතා අවබෝධ කරගත්තේය.

දුරවබෝධ පද

शिशुः – පැටවා **अनुसरणं** – පසුපසින් යෑම **विस्मरति** – අමතක වේ **रोदनं** – ඇඬීම **सुकोमलं** – සුකොමළ **ज्ञात्वा** – දැන **करुणतया** – කරුණාවෙන් **नेष्यामि** – ගෙන යන්නෙමි **परिचिता** – අඳුනන/හුරුපුරුදු **भवन्तं** – පින්වතා, ඔබ **अपरिचित** – නුපුරුදු **विषये** – ගැන/ සම්බන්ධයෙන් (**मम विषये मा चिन्तयतु** – මා ගැන එහෙම හිතන්න එපා) **न्यग्रोधवृक्षः** – නුගගස **अन्विष्यति** – සොයන්නේය **अस्य** – මොහුකෙරෙහි **शिशुमुखात्** – පැටවාගේ මුවින් **घटनां** – කැගැසීම **क्रुध्यति** – කිපෙයි **प्रहरति** – පහරදෙයි **पलायाति** – පැන යයි **अपरिचितस्य** – නුපුරුදු කෙනෙකුගේ **उपरि** – උඩ/මත **छेदनीयम्** – නොබිඳිය යුතුය

०४ सम्भाषणम्

सुमनः - नमस्कारः

සුමන - ආයුබෝවන් (නමස්කාර වේවා)

रतनः - स्वागतम्। इदमासनम् अलङ्करोतु।

රතන - (ඔබව) සාදරයෙන් පිළිගන්නව. එන්න වාඩි වෙන්න.

रतनः - कथयतु भवान् किम् इच्छति चायं वा कोपेयं वा पानकं वा ?

රතන - කියන්න ඔබ මොනව බොන්ඩද කැමති. තේ කෝපි හෝ වෙනත් බීමක්?

सुमनः - धन्यवादः। चिन्ता मास्तु।

සුමන - ස්තුතියි. කරදර වෙන්න එපා.

रतनः - मा एवं वदतु। चायाचषकं पिबावः।

රතන - එහෙම කියන්න එපා තේ කෝප්පයක් බොමු.

सुमनः - साधु तथा अस्तु।

රතන - හොඳයි එහෙම කරමු.

रतनः - शोभनम्। क्षणं तिष्ठतु।

රතන - හොඳයි. මොහොතක් ඉන්න.

रतनः - इदं गृह्णातु। पिवतु। कथम् ? मधुरम् अस्ति?।

රතන - මේක ගන්න. බොන්න කොහොමද? රසද?

सुमनः - आम् मधुरं अस्ति।

සුමන - ඔව් රසයි.

रतनः - किञ्चित् अधिकम् ?

රතන - මොනවහරි වැඩියි ද?

सुमनः - न हि पर्याप्तम् ।

සුමන - නෑ ප්‍රමාණයට තියෙනව

रतनः - कथं भोः? तव गृहे सर्वं अपि कुशलम् ?

රතන - කොහොමද ඉතින් ගෙදර සියලු දෙනා හොඳින් ඉන්නවද?

सुमनः - आम् त्रिशरणप्रसादात् सर्वं कुशलम् ।

සුමන - ඔව් තෙරුවන් සරණින් සියල්ලෝ ම හොඳින් ඉන්නව.

रतनः - अद्य भवान् अत्र मध्याह्नभोजनं करोतु। अनन्तरं किं न गमनीयः।

රතන - අද ඔබ මෙහෙ දහවල් කෑම ගන්න. ඊට පස්සෙ යන්න බැරියැ.

सुमनः - कः विशेषः?

සුමන - මොකක්ද විශේෂය?

रतनः - न कोऽपि विशेषः ।

රතන - කිසිම විශේෂයක් නෑ

सुमनः - तर्हि अद्य न। अन्यदिने। अधुना अहं गन्तव्यम्। बहु विलम्बः जातः।

සුමන - එහෙනම් අද නොවේ. වෙන දවසක. දැන් මම යන්න ඕනෙ. හුඟක් පරක්කු වුණා

रतनः - या इच्छा भवतः।

රතන - ඔබේ කැමැත්තක්

सुमनः - त्रिशरणशरणमस्तु। पुनः मिलामः ।

සුමන - තෙරුවන් සරණයි. නැවත හමුවෙමු.
रतनः - तथामस्तु। पन्थानः सन्तु ते शिवाः।
රතන - එසේම වේවා. සුබ ගමන් !

දුරවබෝධ පද

स्वागतम् - ආයුබෝවන් **अलङ्करोतु** - හොබවන්න **इच्छति**-කැමතිවෙයි **चायं वा / कोपेयं वा / पानकं वा**- තේ හෝ කෝපි හෝ බීමක් හෝ **धन्यवादः** - ස්තුතියි **किञ्चित्** - කිසිවක් **अधिकम्** - වැඩියි ද **पर्याप्तम्** - ප්‍රමාණවත් **अपि सर्वं कुशलम्** - සියල්ල හොඳයි ද **त्रिशरणप्रसादात्**-තෙරුවන් සරණින් **कः विशेषः** - විශේෂය කවරක්ද **तर्हि** - එකල්හි **विलम्बः जातः** - පරක්කු වුණා **या इच्छा भवतः** - ඔබේ කැමැත්තක් **पुनः मिलामः** - නැවත හමුවෙමු

०५ चटक चटक

चटक चटक रे चटक ॥
चिव् चिव् कूजसि त्वं विहग ॥
नीडे निवससि सुखेन डयसे
खादसि फलानि मधुराणि ॥
विहरसि विमले विपुले गगने ॥
नास्ति जनः खलु वारयिता ॥
चटक चटक रे चटक ॥
मातापितराविह मम न स्तः
एकाकी खलु खिन्नोऽहम् ॥
एहि समीपं चिव् चिव् मित्र ॥
ददामि तुभ्यं बहुधान्यम् ॥

चटक चटक रे चटक ॥

चणकं स्वीकुरु पिब रे नीरं

त्वं पुनरपि रट चिव् चिव् चिव् ॥

तोषय मां कुरु मधुरालापम् ॥

पाठय मामपि तव भाषाम् ॥

चटक चटक रे चटक ॥

අර්ථ පරිවර්තනය

ගේ කුරුල්ලෝ

ගේ කුරුල්ලො ගේ කුරුල්ලො
චිව් චිව් නද දෙයි නුඹ කුරුල්ලො
කුඩුවෙහි වසනෙහි සැප සේ ඉගිලෙහි
පළතුරු කන්නෙහි මිහිර ඇති
වසනෙහි අහසෙහි විශාල නිමලැති
කිසි මිනිසෙක් නැහැ නුඹ වළකා
ගේ කුරුල්ලො ගේ කුරුල්ලො......//
මෙහි මගෙ මව්පියෝ කිසිවෙක් නොම වෙත්
දුක් පත් මම මෙහි තනිව වෙසෙමි
එනු මැන අසළට චිව් චිව් මිතුර
ධාන්‍ය නුඹහට දෙමි බෙහෙවින්
ගේ කුරුල්ලො ගේ කුරුල්ලො......//
මෑ ඇට පිළිගනු මිතුරේ දියබොනු
නඳදෙව නැවතත් චිව් චිව් චිව්
මිහිරි කථාවෙන් තුටුකර මා යළි
මට ද උගන්නව නුඹෙ බස දැන්
ගේ කුරුල්ලො ගේ කුරුල්ලො................

දුරවබෝධ පද

रे - එම්බා/පින්වත් **चटकः** - ගේ කුරුල්ලා **डयति** - ඉගිලෙයි **विपुल** - මහත් **वारयति** - වළකයි **एकाकी** -තනිව **खिन्नोऽहम्** **(खिन्नः+अहम्)** දුකටපත්/දුක්මුසු මා **चणकं** - මෑ/කඩල **स्वीकुरु**- පිළිගන්න **नीरं** - වතුර **रटति** - නාද කරයි **मधुरालापम्** **(मधुर+आलापम्)**- මිහිරි වදන් **पाठयति** - උගන්වයි **मामपि** **(मम+अपि)** - මමත් **तव** - නුඹේ **भाषाम्** - භාෂාව

०६ सत्यं जयति नानृतम्।

आसीत् पुरा सुवर्णपुरे धनवान् कश्चित् वैश्यः। तस्य द्वे भार्ये आस्ताम्। तयोर्ज्यायसी वन्ध्या। कनीयसी तु पुत्रमेकं अलभत्। ते द्वे अपि तं बालं स्नेहेनापोषयताम्।

अथ कियताऽपि कालेन स वैश्यः मृतः। तस्य सर्वमपि धनं पुत्रिणीं कनीयसीं गच्छति स्म। ज्यायसी तु तन्नसाहत। अतः सा व्यचिन्तयत् यदि शिशुमिमं मदीयं कथयिष्यामि तर्हि महदिदं धनं मामेष्यति इति। एवं विचिन्त्य सा बालकमादाय प्रतस्थे। कनीयसी तां वारयति स्म।

ततः कलहायमाने ते न्यायाधिपमगच्छताम्। उभे अपि तस्याग्रे ममायं शिशुः ममायं शिशुः इति अवदताम्। न्यायाधिपो विवादस्य रहस्यां ज्ञातुं इच्छन् स्वभृत्यमकथयत् यद्युभयोरयं शिशुस्तर्हि तं छित्वा समं विभज्य उभाभ्यां यच्छ इति। तच्छ्रुत्वा ज्यायसी साधु स्वामिन् साधु। एवं क्रियताम् इत्युच्चैरवोचत्। कनीयसी तु व्याकुली भूत्वा जगाद-स्वामिन् तदीय एवायं बालो न मदीयः। तस्मात् सजीवोऽयं तस्यै दीयताम् इति॥

न्यायाधिपस्तदाकर्ण्य विस्मयमानः कनीयसीमेव शिशोर्जननी इति निश्चित्य तस्यै शिशुमदात्। ज्यायसी तु जनैरुपहास्यमाना प्रत्यागच्छत्। अतः सत्यं जयति नानृतम् इति जनाः वदन्ति।

අර්ථ පරිවර්තනය

සත්‍ය දිනයි බොරුව නොදිනයි

පෙර ස්වර්ණපුරයෙහි කිසියම් ධනවත් වෙළෙන්දෙක් විසීය. ඔහුට බිරින්දෑවරු දෙදෙනෙක් වූහ. එයින් ජ්‍යෙෂ්ඨ තැනැත්තිය වඳ එකියකි. කනිෂ්ඨ තැනැත්තිය එක් පුතෙකු ලැබුවාය. ඒ දෙදෙනාත් එම දරුවා සෙනෙහසින් පෝෂණය කළහ.

ඉක්බිති ටිකකලක් ගතවෙද්දී ඒ වෙළෙන්දා මරණයට පත් විය. ඔහුගේ සියලු ම ධනය දරුවන් ඇත්තියට ම හිමි විය. දෙටු බිරිඳ එය නො ඉවසුවාය. ඉක්බිති ඇය මෙසේ කල්පනා කළාය. ඉදින් මේ දරුවා මගේ යැයි කියන්නෙම් ද එකල්හි මේ මහත් ධනය ද මා කරා එන්නේය. යනුවෙනි. මෙසේ සිතා ඇය දරුවා රැගෙන පිටත් විය. කනිටු බිරිඳ ඇය වැළැක්වූවාය. අනතුරුව කලහකරන්නා වූ ඔවුන් නඩුකාරයකු වෙත එළඹුනහ. දෙදෙනා ම ඔහු ඉදිරියේ දී මේ මගේ දරුවා මේ මගේ දරුවා යැයි කීහ. නඩු විසඳන්නා ද විවාදයේ රහස දැනගනු කැමැත්තේ තම සේවකයකුට ''ඉදින් මේ දරුවා දෙදෙනාගේ ම නම් ඔහු ව කපා සම ව බෙදා දෙදෙනාට ම දෙව'' යැයි කීවේය. ඒ අසා දෙටු බිරිඳ මැනවි ස්වාමීනි මැනවි . එසේ කරනු ලැබේවා යැයි උස් හඬින් කීවාය. කනිටු බිරිඳ ද (කුමක් වේ දැයි) ව්‍යාකුල ව හැඟුම්බර ව කීවාය. ස්වාමීනි මේ දරුවා ඇයගේම ය මගේ නොවේ. එබැවින් ජීවත් වූ ඔහු ඇයට ම දෙනු ලැබේවා යනුවෙනි.

නඩුකාරයා ද එය අසා පුදුම සහගත සිතින් යුතුව දෙටුබිරිඳ ම දරුවාගේ මව යැයි නිශ්චය කොට ඇයට දරුවා දුන්නේය. ජ්‍යෙෂ්ඨ පත්නිය වනාහි මිනිසුන් විසින් උපහාස කරනු ලබන්නී ආපසු ගියාය. එබැවින් සත්‍යය ම දිනයි. බොරුව නො දිනයි. යනුවෙන් මිනිස්සු පවසති.

දුරවබෝධ පද

धनवान् - ධනවත් **कश्चित्** - කිසියම් **वैश्यः** - වෙළෙන්දා **आस्ताम्** - වූහ **तयोर्ज्यायसी (तयोः+ज्यायसी)** - දෙදෙනා අතරින් වැඩිමහලු තැනැත්තිය **कनीयसी** - කනිෂ්ඨ තැනැත්තිය **स्नेहेनापोषयताम् (स्नेहेन + अपोषयताम्)** සෙනෙහසින් පෝෂණය කළහ. **कियताऽपि - (कियत् + अपि)** - කිසියම් **सर्वमपि (सर्व + अपि)** - සියලු **पुत्रिणीं** දරුවන් ඇත්තිය **तन्नसाहत - (तत् + न + साहत)** එය නො ඉවසුවා ය **व्यचिन्तयत्** - සිතීය **यदि** - ඉදින් **शिशुमिमं - (शिशुं+इमं)** මේ දරුවා **मदीयं** - මගේ ය **कथयिष्यामि** - කියන්නෙමි **तर्हि** - එවිට/එකල්හි **महदिदं - (महत्+इदं)** මේ විශාල **मामेष्यति - (माम्+एष्यति)** - මා වෙත එන්නේය **बालकमादाय - (बालकं + आदाय)** - ළමයා ගෙන **प्रतस्थे** - පිටත් විය **वारयति** - වළක්වයි **न्यायाधिपमगच्छताम् -(न्यायाधिपं + अगच्छताम्)** - නඩුවිසඳන්නා වෙත ගියහ **उभे** - දෙදෙනා **तस्याग्रे - (तस्य + अग्रे)** ඔහුගේ ඉදිරිපිට **इच्छन्** - කැමති වන්නේ **स्वभृत्यमकथयत् - (स्वभृत्यं +अकथयत्)** - සිය සේවකයාට කීයේ ය **यद्युभयोरयं - (यदि + उभयोः + अयं)** ඉදින් මේ (දරුවා) මොවුන් දෙදෙනාගේ **छित्वा** - සිඳ, කපා **तच्छ्रुत्वा (तत् + श्रुत्वा)** - එය අසා **क्रियताम्** - කරනු ලැබේවා **इत्युच्चैरवोचत् - (इति+उच्चैः+अवोचत्)** - යනුවෙන් උස්හඬින් කීවාය **जगाद** - හැගුම් බරහඬින් පැවසුවා ය **सजीवोऽयं - (सजीवः + अयं)** - සජීවී මොහු **तस्यै दीयताम्** - ඇයට දෙනු ලැබේවා **विस्मयमानः** - පුදුම සහගත සිතින් **शिशोर्जननी - (शिशोः+जननी)** දරුවාගේ මව **नानृतम् - (न+अनृतम्)** - බොරුව නොවේ.

०७ धिक् पराधीनं जीवनम् ।

एकदा एकः कुक्कुरः शशकस्य आखेटाय वनं प्राविशत्। शशकः तु कुत्रचित् निलीनः अभवत् । परं कुक्कुरः तदैवैकं वृकमपश्यत्।

कुक्कुरः - भोः मया सदृशः त्वं कः असि?

वृकः - अहं वृकः अस्मि। अहं वने एव वसामि। त्वं कः असि?

कुक्कुरः - अहं कुक्कुरः अस्मि। अहं ग्रामे स्वभर्तुः समीपे वसामि।

वृकः - त्वं वने किमर्थं भ्रमसि?

कुक्कुरः - अहं शशकस्य आखेटाय भ्रमामि। अनेन मम मनोरञ्जनम् भवति।

वृकः - त्वमाहारं कथं लभसे?

कुक्कुरः - मम भर्ता मह्यं दुग्धं, मांसम्, रोटिकान् च अपि यच्छति। सः मयि बहु स्निह्यति। आहाराय इतस्ततः न भ्रमामि।

वृकः - अहं तु अतीव काठिन्येन आहारं लभे। कदाचिदेव कस्यापि शशकस्य अन्यस्य वा जन्तोः आखेटं करोमि। अन्यथा मृतानां पशूनामेव मांसं भक्षयामि। तदपि अतिकाठिन्येन लभे।

कुक्कुरः - त्वं मया सह आगच्छ। मम भर्ता त्वमपि पालनं करिष्यति। तुभ्यमपि मांसं, दुग्धं, रोटिकान् च दास्यसि।

वृकः - मम कार्यं किं भविष्यति?

कुक्कुरः - केवलं भर्तुः आज्ञापालमेव तव कार्यं भविष्यति।

वृकः - (कुक्कुरस्य ग्रीवा परितः चर्मपट्टं पश्यति) भोः भोः कुक्कुर तव ग्रीवा परितः इदं किमस्ति?

कुक्कुरः - इदं चर्मपट्टमस्ति। मम भर्ता एतेन पट्टेन सहैव शृंखलां योजयति, मां च बध्नाति।

वृकः - इदं तु पराधीनतयायाः चिह्नमस्ति। अहं पराधीनतां नेच्छामि। वने मम स्वाधीनं जीवनम्। अहं त्वया सह न गमिष्यामि। स्वाधीनतायाः यदि भोजनं कष्टेनापि प्राप्तं भवति, तदपि पराधीनतायाः जीवनात् श्रेष्ठतरमेव। धिक् पराधीनं जीवनम्। अहं तु वने एव स्थास्यामि। (वृकः ततकालमेव गहने वने प्रविशति? कुक्कुरः च स्वभर्तुः समीपं गच्छति)

අර්ථ පරිවර්තනය

07 පරාධීන දිවියට නින්දා වේවා

එක් දිනක් එක්තරා බල්ලෙක් සාවකු අල්වාගැනීම සඳහා වනයට පිවිසියේ ය. සාවා ද කිසියම් තැනක සැඟවුණි. එසේ වුවත් බල්ලා එකල්හි ම එක් වෘකයෙක් දුටුවේය.

බල්ලා – මිතුර, මා හා සමාන නුඹ කවරෙක්ද?

වෘකයා – මම වෘකයෙක් වෙමි. මම කැලයේ ම වාසය කරමි. නුඹ කවරෙක් ද?

බල්ලා – මම බල්ලෙක් වෙමි. මම ගමෙහි මගේ ස්වාමියා සමීපයෙහි වාසය කරමි.

වෘකයා – කුමක් පිණිස නුඹ කැලයෙහි හැසිරෙහි ද?

බල්ලා – මම සාවෙකු දඩයම් කර ගැනීම පිණිස හැසිරෙමි. එයින් මගේ ආශාව සපිරේ.

වෘකයා – නුඹ කෙසේ ආහාර ලබන්නෙහිද?

බල්ලා – මගේ ස්වාමියා මට කිරි ද, මස් ද, රොටී ද දෙයි. ඔහු මා කෙරෙහි බොහෝ සේ සෙනෙහස දක්වයි. අහාර සඳහා එහෙ මෙහෙ නො හැසිරෙමි.

වෘකයා – මම වනාහි ඉතාමත් ම අසීරුවෙන් දුකසේ අහාර ලබන්නෙමි. කිසියම් දිනෙක කිසියම් සාවකුගේ හෝ වෙනත් සතෙකුගේ මරණය සිදු කරමි. නැතහොත් මැරුණු සතුන්ගේ මස් ම අනුභව කරමි. එයත් ඉතාමත් ම දුකසේ ලබනු ලැබේ.

බල්ලා – නුඹ මාත් සමග පැමිණෙන්න. මගේ ස්වාමියා නුඹ ද ඇති කරාවි. නුඹට ද මස් කිරි රොටී ආදිය දෙන්නෙහි ය.

වෘකයා – මගේ රාකාරිය කුමක් වන්නෙහි ද ?

බල්ලා – හුදෙක් ස්වාමියාගේ අණට කීකරුව සිටීම ම නුඹේ කාර්ය ය වන්නේ ය.

වෘකයා – (බල්ලාගේ ගෙළ වටා ඇති සම් පටිය දකියි.) මිතුර මිතුර මේ නුඹේ බෙල්ල වටේ තියෙන්නෙ කුමක් ද?

බල්ලා – මේ සම් පටියක්. මගේ ස්වාමියා මේ පටිය හා දම්වැළ එක්ව යොදා මාව බඳින්නේ ය.

වෘකයා – මෙය වනාහි අනුන්ට පරාධීන (යටත්) වීමේ සංකේතයකි. මම පරාධින බවට නොකැමැත්තෙමි. කැලයෙහි මාගේ ජීවිතය ස්වාධීනය. මම නුඹ සමග නො එන්නෙමි. ඉදින් ස්වාධීන බවින් දුකසේ නමුත් ආහාර ලැබ ගැන්ම සිදුවන්නේය. එය පරාධීන ව ජීවත්වනවාටත් වඩා ශ්‍රේෂ්ඨ ය. පරාධීන දිවියට නින්දා වේවා. මම කැලයෙහි ම නතර වෙමි. වෘකයා එම වෙලාවෙහි ම ඝන කැලෑව තුළට පිවිසේ. බල්ලා ද ස්වකීය ස්වාමියා සමීපයට යයි.

දුරවබෝධ පද

आखेटाय - දඩයම්කර ගැනීමට **कुत्रचित्** - කිසියම් **तदैवैकं** - (तदा + एव + एकं) - එකල්හි ම එක **किमर्थं** - (किं + अर्थं) කුමක් පිණිස **भ्रमसि** - ඇවිදින්නෙහි **अनेन** - මේ **मम** - මගේ **मनोरञ्जनम्** - මනදොළ **त्वमाहारं** - (त्वं + अहारं) නුඹ ආහාර **कुतः** - කොයින් ද **मयि** - මා කෙරෙහි **स्निह्यति** - සෙනෙහස දක්වයි **काठिन्येन** - දුක සේ **जन्तोः** - සතුන්ගේ **अन्यथा** - නැතහොත්/ වෙනත් අයුරකින් **मृतानांपशूनामेव** - (मृतानांपशूनां+एव) මළසිවුපාවුන්ගේ ම **तुभ्यमपि** - (तुभ्यं+अपि) නුඹටත් **परितः** - හාත්පස/ වටේට **चर्मपट्टं** - සමින් කළ පටියක් **एतेन** - මෙයින් **सहैव** - (सह+एव) සමග ම **शृंखलां** - දම්වැළ **योजयति** - යොදයි **बध्नाति** - බඳියි **पराधीनतयायाः** - පරාධීනබව හේතුකොට **चिह्नमस्ति** - (चिह्नं + अस्ति) සංකේතයක් ඇත **नेच्छामि** - (न + इच्छामि) කැමති නොවෙමි **स्वाधीनं** - ස්වාධීන බව **जीवनम्** - ජීවනය **कष्टेनापि** - (कष्टेन+अपि) දුෂ්කරව නමුත් **गहने** - ආකීර්ණ/ ගැවසුණු/ අධික/ ඝන

०८ पठामि संस्कृतं नित्यं

पठामि संस्कृतं नित्यं - वदामि संस्कृतं सदा।
ध्यायामि संस्कृतं सम्यक् - वन्दे संस्कृत मातरम्॥
संस्कृतस्य प्रसाराय - नैजं सर्वं ददाम्यहम्।
संस्कृतस्य सदा भक्तो - वन्दे संस्कृत मातरम्॥
संस्कृतस्य कृते जीवम् - संस्कृतस्य कृते जयम्।
आत्मानमाहुतं मन्ये - वन्दे संस्कृत मातरम्॥

දුරවබෝධ පද

नित्यं - නිතර **ध्यायामि** - වඩමි **सम्यक्** - මැනවින් **प्रसाराय** - පැතිරවීම සඳහා **नैजं** - තමන්ගෙ **ददाम्यहम्** (ददामि+अहम्)- මම දෙමි **भक्तः** - භක්ති ඇත්තා **कृते** - කළ කල්හි **जीवम्** - ජීවිතය **आत्मानमाहुतं** (आत्मानं+आहुतं) - තමා විසින් කැඳවන ලද **मन्ये** - සිතනු ලැබේ.